# සමෘද්ධි බැංකු සංගම්හි ණය කටයුතු සම්බන්ධ ක්‍රියාවලිය

## රටවිරුවෝ නිවාස ණය යෝජනා වැඩසටහන

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට දහනමවන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,
   සමෘද්ධි බැංකු සංගමය, …………………………..

2. කළමනාකරු,
   සමෘද්ධි බැංකු සංගමය, …………………………..

3. සභාපති, විධායක කමිටුව,
   සමෘද්ධි මහ සංගමය, …………………………

4. කළමනාකාර අධ්‍යක්ෂ,
   සමෘද්ධි මහ සංගමය, ……………………………………

5. මුලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, …………………………

6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, …………………………………

7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, …………………………………

8. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, …………………………………

9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, …………………………………

10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,
    කොළඹ 10.

13. සහකාර අධ්‍යක්ෂ නීති
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

බැංකු මූල්‍ය කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

2013.08.05

දුරකථන අංකය :- 0112 - 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.08.05

# රටවිරුවෝ නිවාස ණය වැඩසටහන

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට දහනමවන එකතුව**

**1. හැදින්වීම.**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයඑක්වක්‍රියාත්මක කරනු ලබන "රටවිරුවෝ" නිවාස ණය වැඩසටහන යටතේ ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියා පදිංචි වී විදේශගතවන ශ්‍රමිකයන් සඳහා රුපියල් ලක්ෂ තුනක (ලක්ෂ 3ක්) ණය මුදලක් ලබාදීම සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් හා බැංකු සංගම් මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම හා ඊට මග පෙන්වීම සඳහා මෙහෙයුම් උපදෙස් අංක 4 ට දහසය හා දාහත් වන එකතුන් මගින් මේ වන විටත් කටයුතු කර ඇත. ඊට අදාල සියළු තොරතුරු හා ඇමුණුම් අන්තර්ජාලය ඔස්සේ සමෘද්ධි වෙබ් අඩවිය තුළින් ද ලබාගත හැකිය.

**2. අරමුණු.**

රට විරුවෝ නිවාස ණය වැඩසටහන යටතේ නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට 16 හා 17 වන එකතුන් මගින් ආවරණය නොවන්නා වූ සහ ප්‍රතිලාභීන් තෝරාගැනීම බැංකු සංගම් වෙත යොමු කිරීම, ණය මුදල් නිදහස් කිරීම, ආපසු අයකර ගැනීම, නිවාස සැලැස්ම තෝරාගැනීම, නිවාස ඉදිකිරීම හා ඊට අදාල වන්නාවූ අනෙකුත් වැදගත් තොරතුරු පිළිබඳ දිස්ත්‍රික් ප්‍රාදේශීය හා බැංකු කලාප මට්ටමින් පැහැදිළි කරගත යුතු කරුණු තවදුරටත් නිරාකරණය කරගැනීම සඳහා මෙම සංශෝධනය නිකුත් කරනු ඇත.

3. නිවාස වැඩසටහන ක්‍රියාත්මක වන අකාරය.

3.1 නිවාස ණය වැඩසටහන යටතේ සුදුසුකම් ලබන ප්‍රතිලාභීන්.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ත කාර්යාංශය යටතේ ලියාපදිංචි වී ප්‍රථමවරට විදේශගතවන, දැනට විදේශගත වී ඇති (වසරකට අඩුකාලයක් තුළ) හා විදේශ ගත වී ආපසු දිවයිනට පැමිණ ඇති (වසරකට අඩු කාලයක් තුළ) ශ්‍රමිකයන් මෙම ණය වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් ලෙස තොරාගත හැකිය.

3.2 ප්‍රතිලාභීන් තෝරාගැනීමේ නිර්නායකයන්.

ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා පහත සඳහන් නිර්නායකයන් සපුරා තිබිය යුතුය.

1. ණය ලබාගන්නා ප්‍රතිලාභියා අනිවාර්යයෙන්ම විදේශගත විය යුතුය. (මෙය ප්‍රථම වරට විදේශගත වන අය සඳහා බලපානු ඇත. දැනට විදේශ ගත වී ඇති හා විදේශ ගත වී ආපසු පැමිණි අය සඳහා බල නොපානු ඇත.)
2. නිවසක් ඉදිකරගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.
3. නිවසක් ඉදිකරගැනීමේ අවශ්‍යතාවය හා ණය මුදලක් ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කළ යුතුය.
4. නිවසක් ඉදිකර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉඩම් කොටසක් තිබිය යුතුය. (ඒ පිළිබඳ ඉදිරි පරිච්ඡේද වල පැහැදිළි කරනු ඇත.)
5. ප්‍රතිලාභියා විදේශ ගත වූ පසු, සමෘද්ධි බැංකුව සමග ගණුදෙනු කිරීම, නිවාස ඉදිකිරීම කටයුතු වලට සම්බන්ධ වී සහාය ලබාදීම සඳහා දේශීය නියෝජිතයකු පත් කළයුතුය.
6. සමෘද්ධි බැංකු සංගමය පිහිටි කලාපයේ පදිංචි කරුවකු විය යුතුය.
7. දැනටමත් සමෘද්ධි බැංකුව සමග ගණුදෙනු කරන සමෘද්ධි ප්‍රතිලාභියකු, අඩු ආදායම්ලාභියකු හෝ නිවසක් තනා ගැනීමේ අවශ්‍යතාව ඇතිව විදේශ ගත වූ අයකු විය යුතුය.
8. ප්‍රතිලාභියා විදේශගත වූ පසු ඔහුගේ/ඇයගේ ණය වාරිකය සමෘද්ධි බැංකුව වෙත එවීම සඳහා අනේවාසික ගිණුමක් රාජ්‍ය බැංකුවක හෝ පෞද්ගලික වානිජ බැංකුවක තිබිය යුතුය.

3.3 නිවස ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම තෝරාගැනීම, නිවස ඉදිකරනු ලබන ඉඩම සම්බන්ධ දැනට නිකුත්කර ඇති මෙහෙයුම් උපදෙස් අංක 04 ට 16 වන එකතුවේ 7 ඡේදය හා 8 ඡේදයේ 8.1,8.4,8.5 අවලංගු කර පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ඇත.

1. විදේශගත වන ශ්‍රමිකයාට, ඔහුගේ කාලත්‍රයාට සින්නක්කර ඉඩමක් ඇත්නම් එය නිවාස ඉදිකිරීම සඳහා සුදුසුකම් ලබනු ඇත.
2. ශ්‍රමිකයාට හෝ කාලත්‍රයාට ස්වර්ණ භූමි, ජයභූමි හා ඉඩම් ඔප්පුවක් ඇත්නම් නිවාස ඉදිකිරීම සඳහා එය සුදුසුකම් ලබනු ඇත.
3. විදේශගත වන ශ්‍රමිකයාට හෝ කාලත්‍රයාට ඉඩම් කොටසක් නොමැතිව ඔහුගේ දෙමාපියන්ට, සහෝදරයකුට/ සහෝදරියකට දරුවකුට හෝ ඥාතියකුට අයිති සින්නක්කර ඉඩමක් නිවාස ඉදිකරගැනීම සඳහා එකඟතාවය ලබාදෙන්නේ නම් ඉඩමේ හිමිකරුගෙන් අදාල ශ්‍රමිකයාට නිවස

තනාගැනීම සඳහා ඉඩමෙන් කොටසක් ඉදිරියේ දී ලබාදෙන බවත්, නිවාස ඉදිකළ පසු එම ඉඩමෙන් ඉවත් නොකරන, ප්‍රතිලාභියාගේ ජීවිත කාලය පුරාවට එහි සිටීමට එකඟතාවය පලකල ලිපියක් ලබාගත යුතු අතර, එය ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර සහතික කළයුතුය.

4. විදේශගත වන ශ්‍රමිකයාට හෝ කාලත්‍රයාට ඉඩමක් නොමැතිව ඔහුගේ දෙමාපියන්ට, සහෝදර/සහෝදරියකුට හෝ ඥාතියකුට අයිති ස්වර්ණ භූමි, ජයභූමි ඔප්පුවක් සහිත ඉඩමක නිවස ඉදිකර ගැනීමට එකඟතාව ලබාදෙන්නේ නම් එම ඉඩමෙන් කොටසක් පසු අයිතිය පවරාදෙන බවටත්, නිවස ඉදිකළ පසු එම ඉඩමෙන් ඉවත් නොකරන බවට එකඟතා ලිපියක් ලබාගෙන එය ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළයුතු අතර, එම ඉඩමේ ඔප්පුව පවරාදීම දීම පිළිබඳ ප්‍රාදේශීය ලෙක්ම්ගේ එකඟතා ලිපියක් ද ලබාගත යුතුය.

5. විදේශගත වන ශ්‍රමිකයා දැනටමත් රජයේ රක්ෂිතයක අනවසරයෙන් පදිංචි වී ඇත්නම්, නිවස ඉදිකරගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ එකඟතා ලිපියක් ලබාදිය යුතුය.

6. විදේශගත වන ශ්‍රමිකයා දැනට බලපත්‍ර සහිත ඉඩමක පදිංචි වී ඇත්නම්, එම ඉඩමේ නිවසක් ඉදිකරගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ එකඟතා ලිපියක් ලබාදිය යුතුය

7. විදේශගත වන ශ්‍රමිකයා දැනට ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ හෝ රාජ්‍ය වැවිලි සමාගම් වල ඉඩම් කොටසක් පදිංචි වී ඇත්නම් නව නිවස තනාගැනීම සඳහා ඉඩම ඉදිරියේදී පවරා දෙන බවටත් කිසිදු ආකාරයකින් ඉඩමෙන් ඉවත් නොකරන බවටත්, වැවිලි සමාගම් හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ බලධාරීන්ගෙන් එකඟතා ලිපියක් ලබාගත යුතුය.

8. විදේශගත වන ශ්‍රමිකයා පලාත් පාලන ආයතනයකට අයත් ඉඩම් කොටසක පදිංචි වී ඇත්නම් එම ඉඩම් කොටසේ නිවසක් ඉදිකිරීම සඳහා අනුමැතියක් අදාල පලාත් පාලන ආයතනයේ බලධාරීන්ගෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

9. විදේශගත වන ශ්‍රමිකයන් සඳහා ඉඩම් කොටසක් මිලට ගැනීම සඳහා මෙම ණය මුදල් ලබා නොදෙනු ඇත.

10. ශ්‍රමිකයන් විසින් නිවස ඉදිකරනු ලබන ඉඩම් කොටසක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට "උකස" පවරා ගැනීමටත් අවශ්‍ය නොවන අතර, නිවස ඉදිකළ ඉඩම් කොටසින් අදාල ප්‍රතිලාභියා හෝ ඔහුගේ පවුලේ අය ඉවත් නොකරන බවට සහතික වීම ප්‍රමාණවත් වනු ඇත.

04. ප්‍රතිලාභියාගේ (ශ්‍රමිකයාගේ) ස්ථිර පදිංචිය,

1 නිවාස ණය ලබාගැනීම සඳහා ණය අයදුම්පත් කරනු ලබන ප්‍රතිලාභියා ණය මුදල ඉල්ලා සිටින සමෘද්ධි බැංකු කලාපයේ ග්‍රාම නිලධාරි වසමක ස්ථිර පදිංචි විය යුතුය.

2 ප්‍රතිලාභියා ස්ථිර පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාශයෙන් බැහැරව වෙනත් බැංකු කලාපයක ඉඩම පිහිටා ඇත්නම්, ණය මුදල නිදහස් කිරීම දැනට ස්ථිර පදිංචි බැංකු සංගමය මගින් සිදුකරනු

ලබන අතර, ඉදිකිරීම් කටයුතු අදාල බැංකු සංගම් කලාප දෙකෙහිම නිලධාරීන්ගේ අධීක්ෂණය මත සිදුවිය යුතුය.

3. ප්‍රතිලාභියා වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ඉඩම් කැබැල්ලක නිවාස ඉදිකරනු ලබන්නේ නම් දැනට පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි කලාප බැංකුවෙන් ණය මුදල නිදහස් කර ඉදිකිරීම් කටයුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහි හා බැංකු සංගම් දෙකෙහිම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

4. ප්‍රතිලාභියා ඉදිරිපත් කළ ණය අයදුම් පත්‍රයෙහි සඳහන් ලිපිනය ස්ථිර පදිංචි නොමැතිව වෙනත් බැංකු සංගම් කලාපයක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක හෝ දිස්ත්‍රික්කය තාවකාලික හෝස්ථිරව පදිංචිව ඇත්නම් ඒ පිළිබඳ පරීක්ෂා කර බලා අදාල බල ප්‍රදේශය ණය නිදහස් කළයුතුය.

5. ණය අයදුම්පත් සම්පූර්ණ කරගැනීම.

1. විදේශගත වන ශ්‍රමිකයා හෝ දැනට විදේශගත වී සිටින ශ්‍රමිකයා ණය මුදල ලබාගැනීම සඳහා සුදුසුකම් ලබා ඇත්නම්, අදාල ලිපි ලේඛන පහත සඳහන් පරිදි සකස් කරගත යුතුය. ප්‍රථමවරට විදේශගත වන ප්‍රතිලාභියකු විදේශගත වීමට ප්‍රථම ණය අයදුම්පත්, බැංකු ගිණුම් විවෘත කිරීමෙත් අයදුම්පත්, දේපල සඳහා බලය පැවරු නියෝජිතයාගේ ලිපිය, දැනට විදේශගත ශ්‍රමිකයින් සඳහා වන ඇටර්නි බලපත්‍රය ඇමුණුම 01 මගින් දැක්වේ. අනේවාසික විදේශ මුදල් ගිණුමෙන් මුදල් ඉවත් කරගැනීමේ ලිපිය හා අනෙකුත් අවශ්‍ය ගිණුම්පත් සම්පූර්ණ අත්සන් ලබාගත යුතුය.

2. දැනට විදේශගත වී සිටින ප්‍රතිලාභියකු නම් ඔහුගේ දේපල/ බලය පවරනු ලබන නියෝජිතයකු බැංකු සංගමයට පැමිණ අවශ්‍ය ණය අයදුම්පත්, බැංකු ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත්, දේපල බලය පවරන නියෝජිතයා පත් කිරීමේ ලිපිය හා අනේවාසික විදේශ මුදල් ගිණුමේ (NRFC) මුදල් ඉවත් කිරීමට බලය පැවරෙන ලිපි ලේඛන සම්පූර්ණ කර අදාල බැංකු සංගමය මගින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හරහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ත කාර්යාංශයේ විදේශ තැපැල හරහා ශ්‍රමිකයා දැනට සිටින රටේ තනාපති කාර්යාලය හරහා ශ්‍රමිකයාගේ අත්සන ලබාගෙන තනාපති කාර්යාලයේ බලය පැවරු නිලධාරියාගේ අත්සන සහිතව බැංකු සංගම් ගෙන්වා ගත යුතුය.

3. විදේශගත වී දැනට දිවයිනට පැමිණි ප්‍රතිලාභියකු නම් ඇය/ඔහු සතුව අනිවාර්යයෙන්ම සින්නක්කර ඉඩම් කැබැල්ලක් ඔහුගේ/ඇයගේ කාලත්‍රයා නමින් තිබිය යුතු අතර, එම ඉඩම් කොටස සමෘද්ධි බැංකු සංගමයේ උකස් පවරාගැනීමක් සිදුකර ණය මුදල නිදහස් කළ යුතුය. ණය වාරික ගෙවීම අදාල ප්‍රතිලාභියා පෞද්ගලිකව බැංකු සංගමයට ගෙවිය යුතුය.

06. රු.50,000/- ක මූලික තැන්පතු මුදල,

මෙහෙයුම් උපදේස අංක 4 ට දහසය වන එකතුවේ 8 වෙනි ඡේදයේ 8.4 වගන්තිය අවලංගු කරන අතර, මෙහෙයුම් උපදේස අංක 4 ට දාහත්වන එකතුවේ 6 ඡේදයේ 6.1 වගන්තිය පරිදි නිවස ඉදිකිරීම ආරම්භ කිරීමෙන් පසු තැන්පත් කළයුතුය.

07. ඉදිකරනු ලබන නිවසේ සැලැස්ම,

මෙහෙයුම් උපදෙස් අංක 4 ට දහසය වන එකතුවේ 8 ඡේදයේ 8.2 ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන සැලැසුම් අනුව අවශ්‍ය නිවස තෝරාගත යුතුය. එහෙත්, මෙම ලක්ෂ 3 ක ණය මුදල ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ නිකුත් කරනු ලබන්නේ වර්ග අඩි 543 ක නිවාස සැලැස්ම සඳහා වන බැවින්, අනෙකුත් සැලසුම් සඳහා දැරීමට සිදුවන අනෙකුත් වියදම් ප්‍රතිලාභියා විසින් දැරිය යුතුය.

අඩක් නිමකල නිවසක් සඳහා ණය මුදල නිදහස් කරනු ලබන්නේ නම් එය දැනට ලබා දී ඇති, නිවාස සැලැසුම් වලින් බැහැර වන නිසා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ලක්ෂ 3 ක ණය මුදල් සීමාව තුළ ප්‍රතිලාභියාට පදිංචි විය හැකි පරිදි අවශ්‍ය කොටස පමණක් ඉදිකිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීමට කටයුතු කරනු ඇත.

08. නිවස ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය හා පාලනය,

විදේශගත වන හෝ දැනට විදේශගත වී සිටින ශ්‍රමිකයකු සඳහා ණය මුදල් නිදහස් කිරීමට සමෘද්ධි බැංකු සංගමය අවශ්‍ය කටයුතු සිදුකළ පසු අදාල ප්‍රතිලාභියාගේ බැංකු ගිණුමෙන් මුදල් නිදහස් කිරීම සඳහා ආකෘති පත්‍ර අංක 03 මගින් බලය ලබාගත් තැනත්තාට හැකියාව ලැබෙනු ඇත. එහිදී ඇටෝර්නි බලයත්, ලියාපදිංචි කිරීමක් අවශ්‍ය නොවනු ඇත.

ඒ අනුව ණය මුදල් නිදහස් කළ පසු නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා පහත සඳහන් පාර්ශවයන්ගේ අනිවාර්ය සහභාගිත්වයෙන් නිවස ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම, ඉදිකිරීම සඳහා අවශ්‍ය පෙදරේරුවන්, වඩුකාර්මිකයන් හා ශ්‍රමිකයන් යෙදවීම, ප්‍රගතිය ලබාගැනීම, ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම ආදී කටයුතු සඳහා විනිවිදභාවයනේ යුතුව සියළුම කටයුතු සිදුවන බවටත් සහතික විය යුතුය.

09. සහභාගි විය යුතු පාර්ශවයන්

1. විදේශගත ප්‍රතිලාභියාගේ ආකෘති පත්‍ර අංක 03 යටතේ බලය පැවරී ඇති දේශීය නියෝජිතයා.
2. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දිස්ත්‍රික් කළමනාකරු හෝ ඔහුගේ බලය පැවරී ඇති නිලධාරියකු.
3. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ණයනිකුත් කළ බැංකු කලාපයේ ප්‍රතිලාභියා පදිංචි වසමේ සමෘද්ධි සංවර්ධනනිලධාරිනී හා සමෘද්ධි මහ සංගමයේ, සමාජ සංවර්ධන සහාකර නිලධාරීන්.
4. අනෙකුත් අවශ්‍ය අවස්ථාවලදී, බැංකු සංගමයේ කළමනාකරු, ක්ෂේත්‍ර සහකාර, සමෘද්ධි මහ සංගමයේ කළමනාකාර අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරු හා මූලස්ථාන කළමනාකරු වෙත අධීක්ෂණය හ පාලනය සඳහා බලය පැවරෙනු ඇත.
5. ඉදිකිරීම් ආරම්භ කරනු ලබන සෑම වැඩ බිමකම ලොග් පොතක් තැබිය යුතුය. එම ලොග් පොතෙහි නිවස ඉදිකරීම අධීක්ෂණය හා පාලනය සඳහන් කරමින් ව්‍යාපෘතියේ ප්‍රගතිය හා වැඩකටයුත සිදුවන ආකාරය පිළිබඳ සටහන් තැබිය යුතුය.

10. ණය නිදහස් කිරීමෙන් පසු ප්‍රතිලාභියාගේ අනේවාසික විදේශ මුදල් ගිණුමෙන්/ ඉතිරි කිරීමේ ගිණුමෙන් මුදල් නිදහස් කරගැනීමට බැංකුව වෙත බලය පැවරීමේ ආකෘති පත්‍ර 03 මගින් සනාත කර බැංකුව වෙත ඉදිරිපත් කළයුතුය.

11. නිවස ඉදිකිරීමේ ඉලක්කය සපුරාගැනීම.

"රටවිරු නිවාස ණය වැඩසටහන" යටතේ 2013,2014,2015 වර්ෂ තුනක් තුළද, නිවාස 3000 ක් ඉදිකිරීමේ ඉලක්කය වෙත ලඟාවීම සඳහා 2013 අගෝස්තු 31 වන විට එක් බැංකු සංගම් කලාපයකින් එක් නිවසක් හෝ ඉදිකිරීමේ වැඩ පිළිවෙලක් මෙයින් ආරම්භ කළ යුතුය.

මීට අමතරව මෙම නිවාස ව්‍යාපෘතිය සාර්ථක කරගන්නා නිලධාරීන් 5 දෙනෙකු සඳහා තම ප්‍රගතිය මත වසර අවසානයේ විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට විදේශ සේවා නියුක්ති කාර්යාංශය එකඟතාවය පලකර ඇති බව සඳහන් කරමු.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ - බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම්.

# ඇටර්නි බලපත්‍රය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ..................................දරණ ස්ථානයේ පදිංචි ............................ ජා.හැ.අං.......................දරණ මම 2013........... දින සිට විදේශගත වීමට බලාපොරොත්තු වන/ විදේශගතව සිටින බැවින් ශ්‍රී ලංකාව තුල මාගේ නමින් හා මගේ ක්‍රියාවන් නියෝජනය කිරීම සඳහා සුදුසුකම් ඇති අයෙකු නිත්‍යානුකූලව පත්කිරීමට අවශ්‍යව ඇත. එසේ හෙයින් සියළු දෙනා මෙයින් දැනගත යුතුය.

ඉහත කී ඇටර්නි අධිපති .....................වන මම ( ....................... දරණ ස්ථානයේ පදිංචි මාගේ ස්වාමි පුරුෂයා / බිරිද / මව / පියා/ වෙනත් වන (................) ජා.හැ.අං................යන අයට පහත සඳහන් කරනු ලබන සියළුම කාර්යයන් මා නමින් හා මා වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් මෙයින් පත්කර ස්ථිර කර බලය පවරා ඇත. එකී කාරණා කවරේද යත්,

1) මානමින්හාමාවෙනුවෙන් .........................සමෘද්ධිබැංකුසංගමයෙන්.................දින ලබා ගන්නා ලද රු...................ණය මුදල හා ඊට අදාල පොළිය වාරික 60 කින් ගෙවා නිම කිරීමට ඇති බැවින් එකී කාර්යයන් කිරීම සඳහා මගේ ඇටර්නි බලකරුට බලය පවරමි.
2) මා නමින් මා වෙනුවෙන්...................... සමෘද්ධි බැංකු සංගමයේ ............................අංක දරණ සාමාජික තැන්පත් ගිණුමට බැර කර ඇති රු 300000/-ක මුදල කොටස් වශයෙන් ලබාගෙන එකී මුදලින් ගොඩගැනීමට යෝජිත නව නිවස සඳහා සැලසුම් සකස් කිරීම, ඉදිකිරීම, ඉදිකරවා ගැනීම , ඊට අවශ්‍ය ප්‍රාදේශීය සභා / පලාත් සභා අනුමැතිය ලබාගැනීම ආදී සියළුම කටයුතු මා නමින් හා මා වෙනුවෙන් සිදුකිරීම සඳහා මාගේ ඇටර්නි බලකරුට බලය පවරමි.
3) ඉහත කී ණය මුදල හා නිවස ඉදිකිරීම සම්බන්ධව සියළුම ලිපි ලේඛණ අත්සන් කිරීම , ලිපි ලේඛණ ඉදිරිපත් කිරීම භාරගැනීම හා මාගේ දේපල සම්බන්ධයෙන් ආරවුල් විසදීමට නඩු කටයුතු පවත්වාගෙන යාම මා වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම, අධිකරණයෙන් නඩු නියෝග ලබාගැනීමට හා අභියාචනා කිරීම සඳහා මාගේ ඇටර්නි බලකරුට බලය පවරමි.
4) ඉහත කී ණය මුදල යම් විදිහකින් ගෙවා නිමකිරීමට නොහැකි වුවහොත් එම ණය මුදල සඳහා ඇපයක් ලෙස තබා ඇති නිශ්චල දේපොල සම්බන්ධයෙන් ණය හිමිට මනාපයක් කරගැනීම පිණිස බලය ලබාදීම සඳහා මාගේ ඇටර්නි බලකරුට බලය පවරමි.

ඉහත කී ඇටර්නි බලපත්‍රය මාගේ මරණය හෝ නීත්‍යානුකූලව අවලංගු කර දැන්වීම කරන තුරු වලංගුව පවතින අතර, මෙම ඇටර්නි බලපත්‍රය වලංගුව පවතින කාලය තුලදී ඇටර්නි බලකරු විසින් නීත්‍යානුකූලව කරනු ලබන සියළුම ක්‍රියාවන් හා කටයුතු මා විසින් අනුමත කර ස්ථිර කරන අතර, එකී සෑම කටයුත්තක්ම මා වෙනුවෙන් කිරීමට නීත්‍යානුකූල බලය විශේෂයෙන් පවරා දුන් බව තවදුරටත් ප්‍රකාශ කරමි.

ඉහත සඳහන් ඇටර්නි බලපත්‍ර හිමිකරු වන මම සහ ඇටර්නි බලකරු වන අපි මෙයටත් මේ හා සමාන වාසගම් හා දිනයන් දරණ තවත් ලේඛණ දෙකකටත් ..................දින සහ (..........................) දින අත්සන් තැබුවෙමි.

සාක්ෂි

මීට සාක්ෂිකාරයන් වන අප ඉහතඇටර්නි හිමිකරුගේ අත්සන් අත්සන් කල අය හොඳාකාරව හඳුනන

බවද, ඔවුන්ගේ සම්පූර්න නම

රක්ෂාවන් සහ පදිංචි ස්ථාන ඇටර්නි බලකරුගේ අත්සන

හොඳින් දන්නා බවද

සැබෑකොට සහතික කරමි.

1)

2)

සැ.යු:- මෙම ඇටර්නි බලපත්‍රය ණය හිමියා රැකියාවේ නිරත වන විදේශ රටට අදාල ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තානාපති හෝ බලයලත් නිලධාරියකු විසින් තම මුද්‍රාව තබා සහතික කළ යුතුය.